මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்திய மாகாண சபையின் அரச சேவைகள் ஆணைக்குழு
Public Service Commission of Central Provincial Council
අංක 244, කටුගස්තොට පාර, මහනුවර
இல. 244, கடுகஸ்தொட்டை வீதி, கண்டி
No. 244, Katugasthota Road, Kandy.
web site: www.psc.cp.gov.lk
e-mail: psc.cp.gov@gmail.com
කාර්යාලය காரியாலயம் Office 081-2213097
ගල්කම් செயலாளர் Secretary 081-2213096
වට්ස් ඇප් අංකය வட்ஸ்அப் இல. Whatsapp No 070-7213097
ෆැක්ස් பெக்ஸ் Fax 081-2213082

මගේ අංකය எனது இல. My No. CPC/PSC/01/46

ඔබේ අංකය உமது இல Your No.

දිනය திகதி Date 2026.11.02

මධ්‍යම පළාත්
ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සභා ලේකම්,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
ආයතන ප්‍රධානීන්.

රජයේ නිලධරයන් ඉල්ලීම් හෝ අභියාචනා ඉදිරිපත් කිරීමේදී අනුගමය කළ යුතු පිළිවෙල ආයතන සංග්‍රහයේ XXVIII වැනි පරිච්ඡේදයට හා කාර්ය පරිපාටික රීති 292 හා 293 කෙරෙහි අවධානය යොමුකරවීම

රාජ්‍ය සේවයේ නිරත නිලධාරීන් විසින් රාජකාරී අවශ්‍යතාවයක් සඳහා හෝ අභියාචනයක් ඉදිරිපත් කිරීමේදී අනුගමනය කළ යුතු කාර්යාලයීය ක්‍රියා පිළිවෙල ආයතන සංග්‍රහයේ හා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ දක්වා තිබුණ ද ඇතැම් අවස්ථාවල මෙම උපදෙස් නොසළකා විවිධ අභියාචනා, ඉල්ලීම් ලිපි තම ආයතන ප්‍රධානීන් හරහා ඉදිරිපත් නොකර, සෘජුවම මෙම කොමිෂන් සභාව වෙත යොමුකරන අවස්ථා නිරීක්ෂණය වී ඇත.

02. රජයේ සේවයේ නිරත රාජ්‍ය නිලධාරියෙකු යම්කිසි ඉල්ලීමක් හෝ අභියාචනයක් ඉදිරිපත් කළ යුතු ආකාරය සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ **XXVIII වැනි පරිච්ඡේදයේ** 5 වන වගන්තියේ දක්වා ඇති අතර, එහි 5.4 වන උප වගන්තියේ පහත විධිවිධාන සඳහන්ව ඇත.

> **"5.4** ඉල්ලීමක් හෝ අභියාචනයක් හෝ ඉදිරිපත් කළ යුත්තේ ඉල්ලුම්කරුගේ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හා වෙනත් අදාල බලධරයන්ගේ මාර්ගයෙනි.
>
> නිවපු රජයේ නිලධරයෙකුගේ එවැනි ඉල්ලීමක් හෝ අභියාචනයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව අමතා ඇති අවස්ථාවලදී හැර, එම නිලධරයා අන්තිමට සේවය කළ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය."

03. මෙම පළාත්ට අදාළ කරගෙන ඇති 2022.12.14 දිනැති කාර්ය පරිපාටික රීත් හි XXI පරිච්ඡේදයේ 292, 293 වගන්ති වල පහත පරිදි දැක්වේ.

> **"292.** මෙම කාර්ය පටිපාටික රීතීන්හි වෙනත් ආකාරයකට දක්වා ඇති අවස්ථාවලදී හැර අන් සෑම අවස්ථාවකදී ම රජයේ කොමිෂන් සභාව වෙත ලිපි ඉදිරිපත් කල යුත්තේ අදාළ ආයතන ප්‍රධානියා හා අමාත්‍යාංශ ලේකම්වරයා මඟින් පමණක් වන්නේය.
>
> **"293.** කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන සෑම ලිපියක්ම කොමිෂන් සභාවේ ලේකම් වෙත පමණක් යොමු කළ යුතු වන්නේය"

04. එහෙත්, ඇතැම් අවස්ථාවල ඉහත උපදෙස් නොසළකා රාජ්‍ය නිලධාරීන් කටයුතු කරන අවස්ථා ගරු කොමිෂන් සභාවට නිරීක්ෂණය වී ඇති බැවින්, ඔබ අමාත්‍යාංශයේ, දෙපාර්තමේන්තුවේ, ආයතනයේ සේවයේ නිරත සියලු මට්ටමවලට අයත් රාජ්‍ය නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙස ගරු කොමිෂන් සභාවේ උපදෙස් පරිදි මෙයින් කාරුණිකව දැනුම් දෙමි.

05. තවද, ඉහත 02 හා 03 ඡේදවලට අනුකූල නොවන ලිපි සඳහා කිසිදු ඉදිරි කටයුත්තක් සිදු නොවන බවද වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

ගරු කොමිෂන් සභාවේ උපදෙස් පරිදි,

කේ.කේ.ජී.අයි.ඩී.පී. විජේතිලක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.
මධ්‍යම පළාත